රිවිර 2014 අප්‍රේල් මස 13 වැනි දා ඉරිදා

රිවිනෙත



# දියවැඩියාව නිට්ටාවටම සුවකරන විස්කම් ප්‍රතිකාරයක්

"මේ ප්‍රතිකාර ක්‍රමය කොටස් 3කින් සමන්විතයි. පළමුවැනි එක තමයි කළු හීනටි කැඳ යාගුවට මිශ්‍ර කරන සංයෝගය. මේ යාගුව ඉතාම පැරණි වට්ටෝරුවකින් සකසා ගත්ත එකක්. මලියදේව මහ රහතන් වහන්සේට උදරාබාධයක් හැදුණු වෙලාවෙ, 'සුළුගුලු' කියන වෛද්‍යවරයා 'රසගුලු යාගුව' කියල ඖෂධයක් මගින් එය සුව කළා. මම මේ යාගුව නිර්මාණය කළේ ඒ වට්ටෝරුව ආශ්‍රයෙන්.

අසූ වැනි විය ආසන්නයේ සිටින ඇය වසර 20ක පමණ කාලයක් තිස්සේ දියවැඩියාවෙන් පෙළුණු තැනැත්තියකි. ඇගේ පුතා, දුව මෙන්ම ලේලියද බටහිර වෛද්‍යරු වෙති. කොතරම් බටහිර වෛද්‍ය ප්‍රතිකාර කළද රුධිරයේ සීනි මට්ටම අඩු නොවුණ නිසා ඇය මෙන්ම පවුලේ සාමාජිකයන්ද සිට ඇත්තේ මහත් අසහනයෙනි. ලක්ෂ්මන් ඇඹුල්දෙණිය මහතා පිළිබඳව ඔවුන්ට අසන්නට ලැබී ඇත්තේ ඒ අතරතුරය.

මාසයක පමණ කාලයක් ලක්ෂ්මන් ඇඹුල්දෙණිය මහතාගෙන් ප්‍රතිකාර ගත් පසු රුධිරයේ සීනි මට්ටම අඩුවන්නට වූයෙන් දැන් තම බටහිර බෙහෙත් වට්ටෝරුව අඩුවෙමින් පවතින බව ඇය මා සමග කීවේ මහත් සතුටිනි.

පසුගිය සතියේ අපි ඇඹුල්දෙණිය මහතා මන්තර බලයෙන් කුඹුරු කරන හැටි කීවෙමු. අද මේ කියන්නේ ඔහු වෛද්‍ය ශාස්ත්‍රයෙන් පෙන්වන එක් හපන්කමක් පිළිබඳවය. ඒ දියවැඩියාව නිට්ටාවට සුවකිරීමේ හපන්කමයි.

"කොහොමද මේ දියවැඩියා වෙදකමට පෙලඹුණේ?" මම ඇසුවෙමි.

"දැනට අවුරුදු 15කට විතර ඉස්සර මම 'වූෂු' සටන් කලාවේ තියෙන 'ටාජි' කියන ව්‍යායාම ක්‍රමය හැදෑරුවා. මේක චීන භික්ෂූන් වහන්සේලා අභ්‍යන්තර ඉන්ද්‍රියයන් දියුණු කරන්න පාවිච්චි කරපු ව්‍යායාමයක්. මේ ව්‍යායාමය කරන අතරෙදි මම කල්පනා කළා මේ සටන් කලාවෙ දියවැඩියාව සුව කරන්න යොදාගත හැකි ව්‍යායාම ක්‍රම තියෙනවද කියල හොයන්න ඕන කියල.

"ඔය අතරෙදි මට හිතුණ, අපේ පාරම්පරික වෙදකමේ දියවැඩියාව සුවකරන්න පුළුවන් ඖෂධ ගැන සඳහන් වෙලා තියෙනවද කියල හොයන්න ඕන කියල. දියවැඩියාව අපේ සමාජයේ තියෙන විශේෂ

රෝගයක්. මේක නිට්ටාවට හොඳ කරන්න බෑ කියන එක තමයි පොදු සම්මත මතය. ඒ විදිහෙ මතයක් සමාජසම්මත වෙන්නෙ බටහිර වෛද්‍ය විද්‍යාව එහෙම කියන නිසයි.

"ඒ නිසා මම විශේෂයෙන්ම කල්පනා කළේ දියවැඩියාව නිට්ටාවට සුව කරන්න පුළුවන් ක්‍රමවේදයක් ගැනයි. පරම්පරා වෙද පොත්, බටහිර හා අයුර්වේද පොතපත, රෝගීන් හා වෛද්‍යවරුන් ඇසුර කියන මේ හැම ක්‍රමයක්ම යොදාගනිමින් මම මේ ගැන හෙව්වා.

"මෙතනදි මම තේරුම් ගත්තා මේ බටහිර වෛද්‍ය විද්‍යාව 'ටයිප් 1', 'ටයිප් 2' කියල හඳුන්වන දියවැඩියාව ඇත්තම දියවැඩියාව නොවෙන බව.

"අපේ පොතපතේ සඳහන් වෙනවා ප්‍රමේහ 20ක් ගැන. සමහර පොතක ප්‍රමේහ 21ක් ගැන සඳහන් වෙනවා. මේ ප්‍රමේහයක් උත්සන්න වීමෙන් තමයි දියවැඩියාව නැතිනම් රුධිරයේ සීනි වැඩිවීම කියන තත්වය ඇති වෙන්නෙ.

"ප්‍රමේහයේ නිධානය නැත්නම ප්‍රමේහය ඇති වෙන්නට හේතු ගැන මම සොයා බැලුවා. එතනදී මම දැනගත්තා අපේ බුද්ධදාස රජතුමාගෙ වෙද පොත්වල ප්‍රමේහ නිධාන ගැන විස්තරයක් තියෙන බව. ඒ අනුව හිඳුම නැතිනම් වාඩිවීම පිළිබඳ සැප එක් හේතුවක්. සිතිවිලි රහිතව සැප දෙන අසුන්වල නිතර සිටීම ප්‍රමේහයට හේතුවක්. ඒ කියන්නේ ඔහේ ඉන්නවා වාගේ සැප පුටුවල වාඩිවෙලා ඉන්නකොට ප්‍රමේහය හැදෙනවා කියන එකයි.

"තවත් හේතුවක් තමයි නිදි සැප. ඒ කියන්නෙ නිතර නිතර නිදාගන්න තියෙන ආශාව. නිතර නිදාගැනීම. මස් හොදි, මාළු හොදි, දී කිරි වර්ග ආහාරයට ගෙන දවල්ට නිදාගැනීම තවත් හේතුවක්. ඉස්සර කාලෙ මිනිස්සු දවල්ට නිදාගන්න හොඳ නෑ කියල කියන්න හේතුව මේකයි. ඊළඟට හොඳ විස්තරයක් තියෙනව, ජානවලින් එහෙම නැතිනම් පරම්පරාවෙන් ප්‍රමේහය හැදෙනවා කියල.

"යදී මාතා ප්‍රමේහර්තා පිතා මේහා පුරෝතවා තදපත්‍යම් ප්‍රමේහස්‍යාත්

මේ හෝ සං සහ ජහස්වහඃ" කියල ශ්ලෝකයක් තියෙනව බුද්ධදාස රජතුමාගෙ වෙද පොත්වල. මේකෙන් කියන්නෙ, පියාට, මවට ප්‍රමේහය තිබේ නම් දරුවන්ට එය වැලඳීමේ හැකියාව තියෙනවා කියන එකයි. මේක තමයි වර්තමාන විද්‍යාවෙ ජානවලින් බෝවෙනවා කියල කියන්නෙ.

"මේ කොයි හේතුව නිසා හරි හැදෙන ප්‍රමේහ වර්ග 2ක් තියෙනවා. එයින් 10ක් හැදෙන්නෙ කඵවලින් 10යි. කඵ කියල කියන්නෙ සෙම කියලා කිව්වට ඇත්තටම මේක සෙමම නෙවෙයි. ඒක විද්‍යාත්මක කරුණක් නිසා මම පැහැදිලි කරන්න යන්නෙ නෑ. ඊළඟට වාතයෙන් හැදෙන ප්‍රමේහ 4ක් සහ පිත නිසා හැදෙන ප්‍රමේහ 6ක් ගැන අපේ පොත්වල සඳහන් වෙනවා.

මුත්‍රා විශාල ප්‍රමාණයක් වේගයෙන් පිටවෙනව නම් ඒක හස්ති ප්‍රමේහය. ටික ටික නිතර පිටවෙනවා නම් මන්ද්‍ර ප්‍රමේහය. මේ දෙකම කප ප්‍රමේහ. මේ තත්වයන් උත්පන්න වුණාම තමයි දියවැඩියාව කියල අපි කියන තත්වය ඇති වෙන්නෙ." ඇඹුල්දෙණිය මහතා දීර්ඝ විස්තරයක් කළේය.

"දැන් එතකොට දියවැඩියාව නිට්ටාවට සුව කරන්න පුළුවන් ක්‍රමයක් වෙදපොත්වල තිබිල හම්බ වුණාද?" මම ඇසුවෙමි.

"මෙහෙමයි. එහෙම ක්‍රමවේදයක් ගැන අපේ පාරම්පරික වෙදකමේ තිබුණෙ නෑ. නමුත් මම එකතු කරගත්ත සියලු තොරතුරු ඇසුරින් මම ක්‍රමයක් සොයාගත්ත. ඒකෙදි මම කළේ අර රෝග නිධානවලට හේතු වන පදාර්ථ විශ්ලේෂණය කිරීමයි. එහෙම මේ සියලු ප්‍රමේහයන් පිළිබඳව විශ්ලේෂණය කරල ඒ සියලුම ප්‍රමේහයන්ට ප්‍රතිකාර කිරීමට පුළුවන් විදිහේ අලුත්ම ප්‍රතිකාර ක්‍රමවේදයක් නිර්මාණය කළා. ඒ ප්‍රතිකාර මගින් දියවැඩියාව නිට්ටාවටම සුව කරන්න පුළුවන්."

"බටහිර වෛද්‍ය

විද්‍යාවට අනුව නම් දියවැඩියාව නිට්ටාවට සුවකරන්න බෑ, පාලනය කරන්න විතරයි පුළුවන් කියල තමයි විශ්වාස කරන්නෙ. ඔබ කොහොමද ඔය තරම් විශ්වාසයෙන් කියන්නෙ කොහොමද දියවැඩියාව නිට්ටාවටම සුවකරන්න පුළුවන් කියල?" මම ප්‍රශ්න කළෙමි.

"මම එහෙම කියන්නෙ මා කළ පර්යේෂණයේ ප්‍රතිඵල ආශ්‍රයෙනුයි."

"පර්යේෂණාගාර වාර්තාවලින් කියවෙන හුඟක් දේවල් ප්‍රායෝගිකව කරන්න ගියාම සාර්ථක නෑ කියල චෝදනාවක් තියෙනව නේද?"

"වරදවා හිතන්න එපා. මේක පර්යේෂණාගාර වාර්තාවක් නෙවෙයි. මම මේ පර්යේෂණය කළේ රෝගීන් සම්බන්ධ කරගෙන. ප්‍රතිකාරවලින් ඔවුන්ට ලැබෙන සුවය ඇසුරිනුයි මම මේ නිගමනයට ආවෙ. ඒකෙ සාක්කිකාරයො පර්යේෂණ වාර්තා නෙවෙයි. සුවය ලබපු රෝගීන්."

"කොච්චර පිරිසක් ඉන්නවද ඔබේ ප්‍රතිකාරවලින් සුව වුණු?"

"මම මේ පර්යේෂණය කළේ ලිඛිත තොරතුරු එක්රැස් කරමින්. ඒ කියන්නේ රෝගීන්ට ප්‍රතිකාර ආරම්භ කරද්දි ඔවුන් පිළිබඳ සියලු තොරතුරු ලේඛනගත කළා. පුද්ගලික විස්තරවල සිට රෝගයේ තත්වය, රුධිරයේ සීනි මට්ටමමේ තොරතුරු සියල්ල ලේඛනගතකළා. පසුව ඒවා යාවත්කාලීන කළා. එහෙමයි මේ නිගමනයට ආවේ. ඒක මා තනිවම ගත්ත තීරණයක් නොවෙයි. ප්‍රතිකාර ගත් අයගේ සෞඛ්‍ය තත්වයත් ඔවුන්ගේ අදහසුත් එක්ක ගත් නිගමනයක්."

"ඔබ ළඟ තියෙනවද ඒ තොරතුරු?"

මගේ ඒ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ඔහු මට ලිපිගොනුවක් පෙන්වීය. රෝගීන් කීප දෙනෙකුගේ විස්තර එහි තිබුණි.

"මේ පර්යේෂණය සම්බන්ධ කරගත්තෙ තෝරාගත් පිරිසක්. ඔතන තියෙන්නෙ කීපයයි. සමහරු විදේශගත වෙලා ඉන්නෙ. සමහරු තොරතුරු මට තියාගන්න දුන්නෙ නෑ. සමහර අය අකැමැතියි තමන්ගෙ විස්තර පිටට දෙන්න. නමුත් ස්ථිරවම මට කියන්න පුළුවනි. පර්යේෂණය සාර්ථකයි. දියවැඩියාව නිට්ටාවටම සුව කරන්න පුළුවනි."

"ඒ කියන්නෙ ඊට පස්සෙ බේත් කරන්න අවශ්‍ය නෑ කියන එකද?"

"ඇත්තටම ඔව්. ඉන් පස්සෙ ප්‍රතිකාර අවශ්‍ය නෑ කියන එක තමයි මගේ අදහස. නමුත් ප්‍රතිකාර ලබපු අය නැවතත් රෝගය වැළඳෙයි කියන බය

නිසා දිගටම ප්‍රතිකාර ගන්නවා."

"හොඳයි කොහොමද මේ ප්‍රතිකාරය ක්‍රියාත්මක වෙන්නෙ? දියවැඩියාව කියන්නෙ අග්න්‍යාශය දුර්වලවීමනෙ. ඔබ කියන්නෙ මේ ප්‍රතිකාරයෙන් අග්න්‍යාශය ප්‍රකෘති තත්ත්වයට පත්වෙනවා කියන එකද? එහෙම නම් කොහොමද ඒක සිද්ධ වෙන්නෙ කියල පැහැදිලි කිරීමක් කරන්න පුළුවනිද?"

"මේ ප්‍රතිකාර ක්‍රමය කොටස් 3කින් සමන්විතයි. පළමුවැනි එක තමයි කළු හීනටි කැඳ යාගුවට මිශ්‍ර කරන සංයෝගය. මේ යාගුව ඉතාම පැරණි වට්ටෝරුවකින් සකසා ගත්ත එකක්. මලියදේව මහ රහතන් වහන්සේට උදරාබාධයක් හැදුණු වෙලාවෙ, 'සුළුගුලු' කියන වෛද්‍යවරයා 'රසගුලු යාගුව' කියල ඖෂධයක් මගින් එය සුව කළා. මම මේ යාගුව නිර්මාණය කළේ ඒ වට්ටොරුව ආශ්‍රයෙන්. ඒකෙන් සිද්ධ වෙන්න ඔබ අර අහපු විදිහයට අග්න්‍යාශය ප්‍රකෘති තත්ත්වයට පත්වීමයි. බටහිර ඖෂධවලින් හා ආහාරවලට එක් කර ඇති රසායනික වර්ග නිසා අග්න්‍යාශයේ තැන්පත්වෙලා තියෙන විෂ ඉවත් කිරීමත් එයින් සිද්ධ වෙනවා.

"දෙවැන්න වතුරෙන් දිය කරල ඇඟේ ගාගන්න දෙන කල්කයක්. මේක ඇඟේ ගාගනිද්දි ව්‍යායාමයකුත් සිද්ධ වෙනවා. ඒ වගේම සම හරහා කප, පිත, වාතය සමනය කෙරෙන ඖෂධ සිරුරට ඇතුළු වෙනවා.

"ඊළඟ ඖෂධය දිවේ තබාගන්න දෙන ලේහයක්. එයින් ශාරීරික හා මානසික ශක්තියත් තාරුණ්‍යයත් ලැබෙනවා.

"මීට අමතරව ප්‍රතිකාර ගන්න අයට වූෂු සටන් කලාවේ මා කියපු අර ටාජී ව්‍යායාමය ක්‍රමයට ඇතුළත් 'හෝල්ඩින් බෝල්ඩ්' කියන ව්‍යායාමය කරන්න පුරුදු කරනවා. ඒ මගින් ශරීරයේ අභ්‍යන්තර ඉන්ද්‍රියන් ප්‍රාණවත් වෙනවා, ප්‍රකෘතියට පත් කෙරෙනවා.

"මේ සියල්ල ඉතාම විද්‍යානුකූල පදනමක් යටතේ කෙරෙන ප්‍රතිකාර. මේ පර්යේෂණයට සම්බන්ධ කරගත්ත සියලු දෙනා ආසියානු ජාතිකයන්. දැන් තියෙන්නෙ මේක යුරෝපීන්ට බලපාන්නෙ කොහොමද කියන එක ගැන පර්යේෂණ කරන්න විතරයි. මගේ උත්සාහය මෙයට අන්තර්ජාතික පිළිගැනීමක් ලබාගැනීම සඳහා මේ

ප්‍රතිකාර ක්‍රමවේදය කැනඩාවේ සහ ජිනීවාවල ලියාපදිංචි කිරීමයි. ලෝකයට නව ඖෂධ හඳුන්වාදීම පිළිබඳව එම රටවල් දෙකට විශාල කීර්තියක් තිබෙනවා." ඔහු කීයේ ඇඩි ආත්ම විශ්වාසයකිනි.

ඇඹුල්දෙණිය මහතාගේ නිවෙසේ එදින ඉර බසිනා තෙක් සිටි මම ඔහුගෙන් ප්‍රතිකාර පතා ආ කීප දෙනෙකු සමග සංලාපයේ යෙදෙමින් ඔහුගේ ප්‍රතිකාර පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම් එක්රැස් කරගතිමි. ඔහුගේ ප්‍රතිකාරවලින් සුවය ලැබූ කිහිප දෙනෙකු සමග දුරකථනය ඔස්සේ සම්බන්ධවී තොරතුරු ලබාගැනීමටද මට හැකි විය.

**නාරද කරුණාතිලක**